**අත්තනගල්ල ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

----------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

1.6.1. **ගිණුම්කරණ අඩුපාඩු**

---

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සේවා සඳහා ගාස්තු ගිණුමේ රු.61,200 ක් අඩුවෙන් සටහන්වීම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. | නිවැරදිව වටිනාකම් සටහන්කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.70,550 ක් වටිනා Virus Guard පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය පරිගණක මෘදුකාංග යටතේ ප්‍රාග්ධනිතකර තිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. | වියදමක් ලෙස ගිණුම් ගතකළයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.73,750 ක් වටිනා T 2309 ටෝනර් සහ Epson රිබන් පරිගණක යටතේ ප්‍රින්ටර් මිලදීගැනීමක් ලෙස ප්‍රාග්ධනිතකර තිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. | වියදමක් ලෙස ගිණුම් ගතකළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.6,500 ක් වටිනා විල්බැරෝ 01 ක් හා රු.4,200 ක් වටිනා පොළව විදින උපකරණයක් මිලදීගැනීම සඳහා වැය වූ මුදල මංමාවත්, බෝක්කු, පාලම් යටතේ ප්‍රාග්ධනිතකර තිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. | වියදමක් ලෙස ගිණුම් ගතකළයුතු වේ. |
| (ඉ) | එකතු වටිනාකම රු.1,560,190 ක් වූ අලුත්වැඩියා නඩත්තු වියදම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ගිණුමේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව රු.19,136,354 ක් වූ පුස්තකාල පොත් ඉතිරි තොගය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.17,932,689 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,203,665 ක් අඩුවෙන් පෙන්වා තිබුණු අතර වත්කම් හා වගකීම් ප්‍රකාශයේ එය ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. | සමීක්ෂණ වාර්තාව හා නොසැසඳීමට හේතු සෝයා පිළියම් යොදා නිවැරදි කළයුතු වේ. |
| (උ) | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව පරිගණක මෘදුකාංග ජංගම නොවන වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගන්නා බව සඳහන් වුවද, වසර ගණනාවක සිට ක්‍රියාත්මකව පවතින වරිපනම් බදු, වෙනත් ආදායම් හා හිඟහිටි ආදායම් කළමනාකරණය හා ගබඩා පරිපාලනය සඳහා යොදාගන්නා රු.1,460,000 ක වටිනා මෘදුකාංග පද්ධතිය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කරමි. | මෘදුකාංග පද්ධතිය ප්‍රාග්ධනිත කළයුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පරිපාලන වියදම් ලෙස ලැබියයුතු රු.305,555 ක් ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් පෙන්වා තිබුණි. | ලැබිය යුතු පරිපාලන වියදම් මුදල රු.305,555 ක් විය යුතු අතර ඉතිරි රු.394,200 ක මුදල අදාල ව්‍යාපෘතිය සඳහා වන මුදල වේ. එබැවින් පරිපාලන වියදම වන රු.305,555 ක මුදල ගිණුම් ගත කිරීම ජර්නල් සටහනක් මගින් ඉදිරිපත් කරමි. | ලැබියයුතු පරිපාලන වියදම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.332,622,196 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන වලින් වර්ෂයට අදාල ප්‍රමාණය වන රු.33,262,220 ක පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් ගිණුමට මාරු නොකිරීම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අතිරික්තය රු.33,262,220 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයට අදාලව හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන නොමැති අතර එය 2021 ගිණුම් සැකසීමේදී ගලපනු ලැබේ. | ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමිත පරිදි ගිණුම් තැබීමට කටයුතු කළයුතු වේ. |
| (ඒ) | දේපල ණය පොළී වියදම රු.717,982 ක් මූල්‍ය ප්‍රකාශන වල ගලපා තිබුණද එයට අදාල ලෙජර් ගිණුමක් පිළියෙලකර නොතිබුණු අතර දේපල ණය පොළී වියදම් අදාල වැය කේතයට හර නොකර ණයගැති ශේෂ පියවීමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | 202 වර්ෂයේ සිට දේපළ ණය පොළී සඳහා ලෙජර් ගිණුමක් පවත්වාගෙන යාමටද කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපූරණය වියයුතු ව්‍යාපෘති 522 කට අදාලව ණයහිමි ලෙස ගිණුම්ගත කරන ලද රු.216,844,950 ක් ණයගැතියන් ලෙස ගිණුම්ගතකර නොතිබුණි. | 2021 වර්ෂයේදී ජනල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ණයගැති ලෙස ගිණුම් ගතකළයුතු වේ. . |
| (ඕ) | බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 27 දිනැති LGD/09/2019/01 චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් හා වගකීම් නිවැරදි ප්‍රභේදය යටතේ වර්ගීකරණය කළයුතු වුවද රු.13, 903,523 ක් වටිනා වත්කම් වෙනත් අයිතම යටතේ ගිණුම්ගතකර තිබුණි. එම ස්ථාවර වත්කම්, අදාල වර්ගීකරණයන් යටතේ ක්ෂය කළයුතු වුවද, නිවැරදි ප්‍රභේදයන් යටතේ වර්ගීකරණය නොකිරීම හේතුවෙන් නිශ්චිත ක්ෂය අනුපාත තීරණය කළ නොහැකි වීමෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනයකර ගිණුම්ගතකර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සැකසීමේදී වෙනත් අයිතම යටතේ ඇති වත්කම් නැවත වර්ගීකරණය කර 2020 සඳහා ක්ෂය ගණනය කර ජනල් සටහන් මගින් නිවැරදි ලෙස ගිණුම්ගත කරන බව දන්වා සිටිමි. | ක්ෂය ගණනයකර ගිණුම් ගතකළයුතු වේ. |
| (ක) | එකතු වටිනාකම රු.2,887,276,847 ක් වූ ක්ෂය කළයුතු ස්ථාවර වත්කම් සඳහා 2020 වර්ෂයට ක්ෂය ගණනයකර ගිණුම්ගතකර නොතිබුණු බැවින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අතිරික්තය රු.224,165, 989 ක් වැඩියෙන්ද, වත්කම් හා වගකීම් ප්‍රකාශයේ දේපල පිරියත සහ උපකරණ ශේෂය රු.224,165, 989 කින් වැඩියෙන්ද දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී ජනල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ක්ෂය ගණනයකර ගිණුම් ගතකළයුතු වේ. |
| (ඛ) | විවිධ ණයහිමි පාලන ගිණුම රු.4,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | 2021 වර්ෂයේදී ජනල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ග) | පරිපාලන වියදම් 01-1400 සඳහා රු.4,000 ක් අඩුවෙන් සටහන් කිරීම නිසා විස්තීර්ණ ආදායම් ගිණුමේ අතිරික්තය එම වටිනාකමින් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | 2021 වර්ෂයේදී ජනල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ඝ) | සේවක අර්ථසාධක අරමුදලේ වාරික ගෙවීම ප්‍රමාද වීම මත ගෙවියයුතු රු.162,151 ක අධිභාර මුදල මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව්කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ජර්නල් සටහනක් මගින් නිවැරදි කරනු ලැබේ. | අධිභාර මුදල මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළයුතු වේ. |

1.6.2 **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.563,614,382 ක් වූ ගිණුම් විෂයන් 4 කට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 2021 ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| 571(1) | වර්ෂ 2 ක් ඉක්මවූ රු.7,946,976 ක ගිවිසුම් ඇප තැන්පතු, ටෙන්ඩර් ඇප තැන්පතු, කර්මාන්ත ඇප තැන්පතු සහ විවිධ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019/2020/2021 වර්ෂ වලදී ඇති වූ තත්වයන් නිසා අදාල පාර්ශයවයන් ඒ පිළිබද දැනුවත් කලත් ඒ සදහා ප්‍රතිචාර දක්වා නොමැත. ඔවුන් නැවතත් දැනුවත්කොට ඊට ප්‍රතිචාර නොදක්වන්නේ නම් එය රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.82,341,448 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.91,466,240 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1. කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වේයන්ගොඩ උපකාර්යාලයට අයත් කඩකාමර 23 කින් අයවියයුතු වර්ෂ 10 කට වඩා පැරණි රු.3,276,363 ක්වූ පෙරමුදල් ශේෂය විධිමත් ගිවිසුම් නොමැති විම මත අයකර ගැනීමට නොහැකිව පැවති අතර කපා හැරීම සඳහා සභාවට ඉදිරිපත් කර ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කරමින් පැවතුණි. | වේයන්ගොඩ උප කාර්යාලයට අයත් කඩ කාමර 23 න් කඩ කාමර 05 ක් (රු.667,126) සීල් තබා සභාවට පවරාගෙන නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත් මෙම කඩ කාමර වල පෙර මුදල් නොගෙවූ කඩ කාමර හිමියන් සඳහා නීතිමය කටයුතු කිරීමට නොහැකි වන්නේ විධිමත් ගිවිසුමක් නොමැතිවීම මතය. වර්තමානයේ ඔවුන් නව ගිවිසුමකට ඇතුලත් කර ගැනීමට සාකච්ඡා පැවැත්වුවද එම වෙළදපලේ භෞතික සැලැස්මේ ඇති දෝෂ වල ඇති ගැටළු නිසා එම උත්සහයද අසාර්ථක වී ඇත.වර්තමානයේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් නව ඉදිකිරීම් සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුවෙමින් පවතී. මෙය දිගින් දිගටම වසර ගණනාවක සිට පවතින ගැටළුවකි.ඒ අනුව උක්ත පෙර මුදල් කපා හැරීම සඳහා සභාවට ඉදිරිපත් කර ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | කඩ කාමර බදු දීමට ප්‍රථම නීත්‍යානුකූලව ගිවිසුමකට එළඹියයුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ කඩකුලී ශේෂය රු.2,435,314 ක් තුල වේයන්ගොඩ උප කාර්යාලයේ මුද්‍රා තබන ලද කඩ කාමර 7 ක වසර 10 වැඩි හිඟය රු.768,610 කඩ කාමර වල ගිවිසුම් හා භෞතික සැලසුමේ ගැටළු නිසා අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිව පැවතුණි. | 2021 මාර්තු මස වන විට මෙම මුදලින් ලක්ෂ 11 ක් අයකරගෙන ඇත.2021 මේ විට ඇති වූ තත්වය මත ඉතිරි මුදල අයකර ගැනීමට බාධා මතුවී ඇත.වේයන්ගොඩ උප කාර්යාලයේ රු.1509755/= මුදලින් මුද්‍රා තබන ලද කඩ කාමර 7 ක වසර 10 වැඩි හිඟ ලෙස රු.768610/= ක මුදලක් අයනොවී ඇත.එසේම මෙම කඩ කාමර වල ගිවිසුම් ගැටළුව නිසාත්, එහි ඇති භෞතික සැලසුමේ ගැටළු නිසාත් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට බාධාවක්ව පවතී. | හිඟ කඩකුලී අයකිරීමේ ක්‍රියාමාර්ගවැඩිදියුණු කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1.1 සන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂයේ කසළ බැහැර කිරීම වෙනුවෙන්, රු.10,895,000 ක් ඇටානාවත්ත කසළ අංගනය වෙත ගෙවීම් කර තිබූ අතර ටෙන්ඩර කොන්දේසි 07 ප්‍රකාරව, අදාල පළාත් පාලන ආයතනයෙන් අවසරය, කොන්දේසි 08 ප්‍රකාරව කසළ බැහැර කරන ස්ථානයේ හිමිකරුගෙන් ලිඛිත එකඟත්වය සහ පරිසර අධිකාරියෙන් පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | එම කසල බැහැර කිරීමේ ටෙන්ඩරය සඳහා මිළ ගණන් කැඳවීම් ටෙන්ඩර් කොන්දේසි වලට අනුකූලව ඉදිරිපත් වු කිසිවකු එකී කොන්දේසි සපුරා නොතිබුණි.එහෙත් එවකට දිනකට රැස්වන කසල ප්‍රමාණය ටොන් 15 ක් ඉවත් කර ගැනීමට නොහැකිව ගොඩ ගැසෙමින් පැවතින.මෙය අර්බුදකාරී තත්වයක්ව පැවතින. ඒ අනුව ඉදිරිපත් වු ටෙන්ඩර්කරුවන් ප්‍රතික්ෂේප වීමක් සිදුකලේ නම් ආයතනයට විකල්ප ක්‍රම නොමැති බැවින් දැඩි අර්බුදයකට යා හැකිව තිබුණි. මේ සියල්ල සලකා බලා එකී ටෙන්ඩර් කොන්දේසි සපුරා නොතිබුණ ද, හදිසි අවශ්‍යාවයක් සේ සලකා අවම මිළ ඉදිරිපත් කරන අයට ටෙන්ඩරය ප්‍රදානය කෙරිනි. | ටෙන්ඩර් කොන්දේසි අනුගමනය කළයුතු වේ. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 38980 දරන ඉඩම් නඩුව සම්බන්ධව සභාව ක්‍රියාකර ඇති ආකාරය අවිධිමත් හා නොසැලකිලිමත්වීම හේතුවෙන් සහා අරමුදලින් පැමිණිලිකරුට 2019 මැයි 16 දින රු.1,876,800 ක් ගෙවා තිබුණි. 2022 අප්‍රේල් 10 දින වන විටත් වගකීම් නිශ්චය කරන පරීක්ෂණයක් සිදුකර සභාවට වූ පාඩුව අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | 1996 වර්ෂයේ සිදුවූ මාර්ගයක ආරවුලක් වෙනුවෙන් 39/380 දරණ ඉඩම් නඩුවට අදාලව උසාවි තීන්දුව ක්‍රියාත්මක කිරීමට සිදුවිය. ඒ අනුව 2019 මැයි මස 16 දින ගෙවන ලද රු.1,876,800 ක මුදල පියවා ගැනීමට එහි වගකීම් නිශ්චය කිරීමට පරීක්ෂණයක් සිදුකිරීම සඳහා සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ලබා දී ඇත. එම වාර්තාව ලබාගැනීම සඳහා සිහිකැඳවීම් යවා ඇත. | හැකි ඉක්මනින් පරීක්ෂණ වාර්තාව ලබාගෙන පාඩුව අයකරගැනීමට කටයුතු කළයුතු වේ. |